# ඓතිහාසික රිදී විහාරයෙන් හමුවන ක්‍රිස්තු චරිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කුමාරි කේ.එච්.එන්.ආර්.**[1]

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිල්ලි හත්පත්තුවේ මාදුරේ කෝරළේ රිදීගම ග්‍රාමයේ පිහිටා ඇති ඓතිහාසික රිදී විහාරය අනුරාධපුර යුගයේදී නිර්මාණය කෙරුණු ඉතා විශිෂ්ඨ නිර්මාණකි. අනුරාධපුර, පොළොන්නරු සහ මහනුවර යන යුග තුනටම අයත් කලා නිර්මාණ රැසක් වර්තමානය දක්වාම ආරක්ෂා වී ඇති මෙම ඓතිහාසික විහාරයේ ඉතා දුර්ලභ ගනයේ පෞරාණික වටිනාකමකින් යුත් පිඟන් ගඩොල් එකසියඅටක් මත නිරූපිත ක්‍රිස්තු චරිතයේ විවිධ විශේෂ අවස්ථාවන් දක්නට ලැබේ. මේ සම්බන්ධයෙන් ඇති විවිධ තොරතුරු අධ්‍යයනය කිරීමත්, ආගමික සහජීවනයෙන් යුත් ශ්‍රී ලාංකේය සමාජ පසුබිම පෙන්වා දීමත් මෙම පර්යේෂනයේ අරමුණයි. මේ හා සම්බන්ධ පර්යේෂණ ක්‍රමවේදය ලෙස පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර, සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කෙරෙන අතර වාර්ථා සහ සම්මුඛ සාකච්ජා භාවිතයට ගැනේ. රිදී විහාරයේ "මහා විහාරය" යනුවෙන් හැඳින්වෙන ප්‍රධාන ලෙන් විහාරයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාව සහිත පීඨිකාවේ ඉදිරිපස මලසුනට මෙම පිඟන් ගඩොල් අල්ලා තිබේ. එහි අඟල් අටක ප්‍රමාණයෙන් යුතු සමචතුරස්‍රාකාර පිඟන් ගඩොල් එකසියඅටක් පමණ දක්නට ලැබේ. මෙම පිඟන් ගඩොල් රිදී විහාරයට ලැබීම පිළිබඳ පවත්නා අදහස වන්නේ මේවා ඕලන්ද ආණ්ඩුකාරවරයකු විසින් රිදී විහාරයේ නායක හිමියන් වෙත ප්‍රදානය කරන ලද බවය. සමහරවිට ඕලන්ද ආණ්ඩුකාරවරයා මෙම විහාරය හා විශේෂ සම්බන්ධතාවයක් මහනුවර යුගයේදී ඇති කරගෙන තිබූ බව මෙයින් පැහැදිලි ය. මේ වෙනුවෙන් නාවික පහසුකම් සලසන ලද්දේ ද ඕලන්ද ආණ්ඩුකාරවරයාගේ අනුග්‍රහයෙන් වීම සැලකිය යුත්තකි. මෙම පිඟන් ගඩොල් ඕලන්දයේ නිෂ්පාදිත බව තහවුරුව ඇති අතර එවා මලසුනට අල්ලා ඇත්තේ අක්‍රමවත් අයුරිනි. ඊට හේතුව වන්නට ඇත්තේ එහි අන්තර්ගතය හා පිළිවෙළ පිළිබඳව පෙදරේරුවන් තුළ අනවබෝධය විය හැකිය. එසේ වුවද එකල රිදී විහාරයේ වැඩ සිටි භික්ෂූන් මෙහි අන්තර්ගතය කිස්තු ධර්මය හා සම්බන්ධ වන බව නොදැන සිටීමට හේතුවක් නැත. ඒ අනුව මෙය බෞද්ධ භික්ෂූන්ගේ අන්‍ය ආගමික සහනශීලීත්වය පිළිබිඹුවන්නක් ලෙසද ඇගැයීමට ලක්ව තිබේ. ඕලන්ද, බිතාන්‍ය අවධිවලට අයත් පිඟන් ගඩොල් ලක්දිව මුහුදුබඩ ප්‍රදේශවල විහාරස්ථානවලින් ලැබී ඇතත් කුරුසිය සහිත ජේසු බිළිදාගේ උපත දක්වන රූ රටාව ඇති පිඟන් ගඩොල් සහිත එකම විහාරගෙය රිදි විහාරය ලෙස සැලකේ. මෙම පිඟන් ගඩොල්වල සුදු පසුබිමේ නිල් පැහැයෙන් කිස්තු චරිතයේ අවස්ථා මෙන්ම විවිධ සැරසිලිද දක්නට ලැබේ.

**ප්‍රමුඛ පද :** ඕලන්දය, ක්‍රිස්තු චරිතය, පිඟන් ගඩොල්, භික්ෂූන්, රිදී විහාරය

[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය. nadeesharuwanthika9@gmail.com